**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**

**பொலிஸ் ஊடகப் பிரிவு**

**POLICE MEDIA DIVISION**

**14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය<br>Date | 2025.10.29<br>පැය 1240 | දුරකථන අංකය<br>Tel.NO | 011-2887973 | මගේ අංකය<br>My NO | D/Media/Out/1960/2025 | විද්‍යුත් ලිපිනය<br>E-Mails | dir.media@police.gov.lk |

## අවශ්‍ය කරන සැකකාරියක් අත්අඩංගුවට ගැනීම සඳහා මහජන සහය පැතීම.



රුපියල් මිලියන 150 ක් වටිනා ඉඩමකට ව්‍යාජ ලේඛණ සකස් කර දේපල අත්පත් කර ගැනීම සම්බන්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වාණිජ අපරාධ විමර්ශන අංශ 03 මඟින් විමර්ශන ආරම්භ කරන ලදි.

සිද්ධියට සම්බන්ධ සැකකාර කාන්තාව අන්අයෙකු ලෙස පෙනී සිටිමින් ව්‍යාජ ඔප්පුවෙහි අත්සන් කර ඇති අතර, මෙම සැකකාර කාන්තාව පොලිසිය මඟහරිමින් සැඟව සිටී. ඇය පදිංචිව සිටින ස්ථානයක් සම්බන්ධයෙන් මෙතෙක් තොරතුරු අනාවරණය වී නොමැත. (2024.09.18 වන දිනද මෙම සැකකාරිය සම්බන්ධයෙන් මාධ්‍ය නිවේදනයක් නිකුත් කර ඇත)

එබැවින් එම සැකකාරියගේ ඡායාරූපයක් ඔබ මාධ්‍ය වෙත යොමු කරන අතර, සැකකාරිය සම්බන්ධයෙන් යම් තොරතුරක් වෙතොත් පහත සඳහන් දුරකථන අංක වෙත දැනුම් දෙන ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටියි.

**දුරකතන අංක -**

- වාණිජ අපරාධ විමර්ශන 03 අංශය - **011 - 2434504**
- මෙහෙයුම් මැදිරිය (අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව) - **011 - 2422176**

මහජනතාවගේ දැන ගැනීම සඳහා ඉහත නිවේදනය සම්බන්ධයෙන් ඔබ මාධ්‍ය ආයතනය මඟින් ප්‍රචාරයක් ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**